# ඉඩම් අමාත්‍යාංශය
## காணி அமைச்சு
## Ministry of Lands

"මිහිකත මැඳුර",
ඉඩම් ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

"மிஹிகத மெதுர",
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"Mihikatha Medura",
Land Secretariat,
1200/6, Rajamalwatte Avenue,
Battaramulla,


මගේ අංකය / எனது இல. / My No. 6/4/12

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.03. 21

චක්‍රලේඛ - ML/SHG/01/2022

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු සහ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු
සියළුම ප්‍රධාන ලේකම්වරු
සියළුම දිස්ත්‍රික් ලේකම්වරු
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

හරිත ලංකා ජාතික ගෙවතු වගා සංග්‍රාමය - 2022
තිරසර ලෙස ස්ථාපනය කිරීම - " අපේ ගෙවත්තෙන් පටන් ගනිමු"
<u>රාජ්‍ය ආයතන පරිශ්‍රවල හා ඉඩම්වල ගෙවතු වගාව</u>

"ජනතාවට මුහුණ දීමට සිදු වී ඇති ආර්ථික අපහසුතා අවම කිරීම සඳහා වූ ප්‍රධාන යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම" යන මැයෙන් ගරු මුදල් අමාත්‍යතුමා විසින් MF/NB/02/CM/2022/010 හා 2022.01.18 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන හා අමප/22/0075/304/002-II හා 2022.01.25 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය ආයතන පරිශ්‍රවල හා ඉඩම්වල ගෙවතු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් හා මඟපෙන්වීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

01. හැඳින්වීම

ගෙවතු වගා වැඩසටහනට සමගාමීව රජයේ ආයතන පරිශ්‍රවල හා රජය සතු ඉඩම්වල වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මඟින් රජයේ සේවකයින් සහ මහජනතාව තුළ වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීම සහ මහජනතාවට ආදර්ශයක් ලබාදීම අරමුණු කර ගත් ගෙවතු වගා වැඩසටහනක් සැලසුම් කර තිබේ. මෙම වැඩසටහන මෙහෙයවීම හා සම්බන්ධීකරණය සඳහා පහත සඳහන් ජාතික කමිටුව පත්කර ඇත.

- ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය - කමිටු සභාපති
- ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා, ඉඩම් අමාත්‍ය - කමිටු සාමාජික
- ගරු මහින්ද අමරවීර මැතිතුමා, පරිසර අමාත්‍ය - කමිටු සාමාජික
- ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා, කෘෂිකර්ම අමාත්‍ය - කමිටු සාමාජික
- ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කමිටු සාමාජික
- ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කමිටු ලේකම්


ලේකම් / செயலாளர் / Secretary: දුරකථන/தொலைபேசி /Telephone - 011- 2888907, ෆැක්ස් / பெக்ஸ் / Fax - 011- 2887404

කාර්යාලය / அலுவலகம் / Office: දුරකථන/தொலைபேசி /Telephone -011- 2797500, ෆැක්ස් / பெக்ஸ் /Fax - 011- 2887445

මෙම වැඩසටහන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි සඳහන් "සුවදිවිමග" වැඩසටහන යටතේ වසවිසෙන් තොර නිරෝගී ආහාර වේලක් ලබාගැනීම සඳහා ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනයට දායකත්වය සපයන වැඩපිළිවෙලක් ලෙස සේවා ස්ථාන ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

මේ අනුව ආගමික සිද්ධස්ථාන හා පාසැල් ඇතුළු රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ ගෙවතු වගා වැඩසටහන ආදර්ශමත් ගෙවත්තක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා අදාළ ආයතන ප්‍රධානීන්ගේ දායකත්වය ඉල්ලා සිටිනු ලැබේ.

## 02. ගෙවත්ත සැලසුම් කිරීම

ආගමික සිද්ධස්ථාන, පාසැල් ඇතුළු රාජ්‍ය ආයතන පරිශ්‍රවල හා ඉඩම්වල ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම ආයතනවල ඉහළ දායකත්වයක් අපේක්ෂා කරනු ඇත. තම ආයතන පරිශ්‍රවල වගා කටයුතු මහජනතාවට ආදර්ශමත් පරිදි සංවිධානය කිරීමත් ඉහළ ඵලදායිතාවයක් සඳහා නිලධාරීන්ගේ සහාය ලබාදීමත් කාලීන අවශ්‍යතාවයක් සේ සලකා ආයතන සතු සම්පත්, දැනුම, කළමනාකරණ කුසලතා ප්‍රයෝජනයට ගනිමින් ගෙවත්ත සංවිධානය කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කටයුතු සංවිධානය කිරීමට සියළුම ආයතන ප්‍රධානීන්ගේ මැදිහත්වීම අපේක්ෂා කෙරේ.

පරිශ්‍ර ආශ්‍රිත ගෙවත්ත සැලසුම් කිරීමේදී ආයතනය තුළ මේ සම්බන්ධව කුසලතාවයක් පවතින මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු සම්බන්ධීකරණ නිලධාරීවරයෙකු ලෙස පත්කර ගැනීම අපේක්ෂා කරන අතර ආයතනයේ නිලධාරීන්ට පැවරී ඇති රාජකාරිවලට අමතරව නිලධාරීන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහාත් ආයතන පරිශ්‍රය උපරිම පරිදි භාවිතා කිරීම සඳහා ගෙවතු වැඩසටහන සංවිධානය කර ගැනීම සඳහාත් මූලික අවධානය යොමු කිරීම සුදුසු වේ.

මෙම ගෙවතු වැඩසටහනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ හා ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්මයට සම්බන්ධ අනෙකුත් නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම හා උපදෙස්, ගෙවත්ත සැලසුම් කිරීම, බෝග වර්ග තෝරාගැනීම ආදිය සඳහා අවශ්‍යතාවය පරිදි ලබාගැනීමට කටයුතු කිරීම මැනවි.

## 03. ගෙවත්තට බීජ, පැළ ආදී බෝග වර්ග සපයා ගැනීම

ගෙවත්ත සකස් කිරීමේදී බීජ හා පැළ අවශ්‍යතා හැකිතරම් අදාල පරිශ්‍ර භාර ආයතන විසින්ම සපයා ගැනීම මැනවි. රජයේ නිලධාරීන්ගේ නිවාස ආශ්‍රිත ව පවත්නා ගෙවත්ත වගා කිරීම සඳහා ද පෙළඹවීම කළ හැකි අතර පැළ, දඬු හා බීජ හුවමාරු කිරීම වැනි ක්‍රම මඟින් වියදම අවම කරගත හැකිවේ.

<u>ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත ගෙවතු වගා වැඩසටහන</u>

මේ පිළිබඳ කැමැත්තක් දක්වන ආගමික සිද්ධස්ථානවල ගරු විහාරාධිපති ස්වාමීන් වහන්සේලා/ ගරු පූජකතුමන්ලාගේ අනුශාසකත්වය හා ගෞරවනීය දායකත්වය ඉතා වැදගත් වේ. එම වැඩසටහන බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සංවිධානය කරනු ඇත.

කෙරේ. මෙම වැඩසටහන සම්බන්ධ රාජ්‍ය ආයතන විසින් බෝග එළදාව අලෙවියට හෝ නිලධාරීන් අතර බෙදාදීම හා අඛණ්ඩව මෙම ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රමවේද සකස් කර ගත යුතුවේ.

07. කාලසටහන

| වැඩසටහනට අදාළ කාල රාමුව | කාලය |
|---|---|
| 1. සැලසුම් කිරීම/ දැනුවත් කිරීම හා කාර්යයන් පැවරීම | පෙබරවාරි/ මාර්තු |
| 2. වැඩසටහන දිප ව්‍යාප්තව ප්‍රවර්ධනය | මාර්තු මුල් සති 02 තුළ |
| 3. මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම (බීජ/ පැළ/ උපකරණ) | මාර්තු මුල් සති 02 තුළ |
| 4. බිම සකස් කිරීම | මාර්තු අවසාන සති 03 තුළ |
| 5. වැඩසටහන ආරම්භය | මාර්තු 29 දින සිට සතියක් තුළ |
| 6. පැළ හා බීජ සිටුවීම | මාර්තු 29 දින සිට අඛණ්ඩව |
| 7. කාබනික පොහොර සැකසීම, ආදර්ශය සකස්කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යෑම | අඛණ්ඩව |
| 8. නඩත්තුව හා පවත්වාගෙන යෑම (මාස 03 කට වරක් බෝග මාරුව) | අඛණ්ඩව |
| 9. ඇගයීම හා මෙහෙයවීම | අඛණ්ඩව |

මේ සම්බන්ධයෙන් ඔබ විසින් දෙනු ලබන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.ඒ.ඒ.කේ. රණවක
කමිටු ලේකම් හා
ලේකම්, ඉඩම් අමාත්‍යාංශය